## ගම්මිරිස් නිෂ්පාදනය සහ අපනයනය - අතීතය සහ අනාගතය

අපනයන කෘෂිකර්ම බෝග වගාවන් අතුරින් ගම්මිරිස් වගාව කෙරෙහි මහජනතාවගේ හා රටෙහිද විශේෂ උනන්දුවක් පසුගිය වකවානුවේ ඇතිවූ බව කවුරුත් දන්නා කරුණකි. ඊට ප්‍රධාන හේතුව වූයේ ගම්මිරිස් සඳහා හොඳ මිලක් එසේ නැත්නම් හොඳ වෙළඳ පොලක් පැවතීමය. පසුගිය වකවානුවේ වගාකරුවකුට වියළි ගම්මිරිස් කිලෝවක් සඳහා රු:250/- ට ආසන්නව අඩු වැඩිවෙමින් පැවති මිලක් ලබාගැනීමට හැකිවිය. ගම්මිරිස් මිල හොඳ වීමත් සමගම වගාවට හිතැති බොහොමයක් දෙනාගේ විශාල පිබිදීමක් ඇතිවූ අතර ගම්මිරිස් තවාන්වල ගම්මිරිස් පැලයක් සොයාගැනීමට බැරිවන අන්දමින් ඉල්ලුමද වැඩිවිය. වගාබිම් වැඩි කරලීමට තදබල ව්‍යාප්ති උපදෙසක් අවශ්‍ය නොවන තරමට මිල මගින් ගම්මිරිස් පැල හා වගාව සඳහා ඉල්ලුම වැඩි වී තිබුනි. මේ ආකාර ආකර්ශණීය මිල ගණන් පසුගිය කාලය තුල, විශේෂයෙන්ම 1998 වර්ෂය තුල ලැබීමට හේතු වූ කරුණු මොනවාදැයි විමසා බලමු.

ලෝකයේ ගම්මිරිස් වගා කරන ප්‍රධාන රටවල් වනුයේ ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, බ්‍රසීලය, තායිලන්තය, ශ්‍රී ලංකාව, වියට්නාමය හා චීනයයි. මීට අමතරව මැඩගස්කරය හා මෙක්සිකෝවද සැලකිය යුතු මට්ටමින් ගම්මිරිස් වගාව පුළුල් කරමින් සිටී. කෙසේ හෝ මෙම ගම්මිරිස් වවනු ලබන සියලුම රටවල් සැලකූ විට ලෝකයේ වගා බිම් ප්‍රමාණය වාර්ෂිකව වැඩිවෙමින් පවතී. එහෙත් වගා බිම් ප්‍රමාණය කොතෙක් වැඩිවූවද ඊට සරිලන පරිදි ලෝක ගම්මිරිස් නිෂ්පාදනය හා අපනයන පරිමාව 90 දශකය තුල පහල වැටෙමින් පැවතීම විශේෂ කරුණක් වී තිබේ. මීට ප්‍රධාන හේතුන් වනුයේ ගම්මිරිස් එළදාව අඩුවීමත් එක් එක් රටවල ගබඩා කොට තිබූ ගම්මිරිස් ප්‍රමාණයන් වාර්ෂිකව හීන වී යාමත්ය.

| වර්ෂය | වගාබිම් ප්‍රමාණය හෙක්ටයාර් ,000 | නිෂ්පාදනය ,000 මෙ. ටො. | අපනයනය ,000 මෙ. ටො. |
|---|---|---|---|
| 1993 | 378 | 171 | 144 |
| 1994 | 383 | 182 | 142 |
| 1995 | 400 | 193 | 136 |
| 1996 | 406 | 196 | 145 |
| 1997 | 409 | 187 | 138 |
| 1998 | - | 189 | 126 |

1996 වර්ෂයේ ලෝක වෙළඳ පොලට සැපයූ මුලු ගම්මිරිස් ප්‍රමාණය මෙ. ටො. 145,000 ක් වූ අතර එය 1998 වර්ෂය වනවිට මෙ. ටොන් 126,000 දක්වා පහත වැටී ඇත . එමෙන්ම 1996 වර්ෂයේ මුලු ගම්මිරිස් නිෂ්පාදනය මෙ. ටො. 196,000 ක් වූ අතර එය 1998 වර්ෂය වන විට මෙ. ටො. 189,000 ක් දක්වා

පහත වැටී තිබුණි. මේ අනුව ලෝක වෙළඳපොළට ගම්මිරිස් සැපයුමෙහි හිග බවක් ඇති වී ඇත. මීට ප්‍රධාන වශයෙන්ම බ්‍රසීලය, ඉන්දුනිසියාව, මැලේසියාව හා තායිලන්තය වැනි රටවල නිෂ්පාදන අඩුවීම හා අස්ථාවර වීම හේතු වී තිබේ. ඒ හේතු කොටගෙන ලෝක වෙළඳපොළේ ගම්මිරිස් සඳහා මිල ගණන් ඉහල යාමක් සිදුවී ඇති අතර මෙම තත්වය ඉදිරි වර්ෂ 4-5 ක කාලයක් දක්වා බල පැවැත්වෙනු ඇතැයි අනුමාන කළ හැක. එනිසා අපගේ ශ්‍රී ලාංකික වගාකරුවන්ට ඉදිරි වර්ෂ තුලදීත් ස්ථාවර මිලක් ලැබීමට බොහෝ ඉඩකඩ තිබේ. ඒ එසේ වුවත් ඊට සමගාමීව ගම්මිරිස් ආනයන කරනු ලබන ප්‍රධාන රටවල් කිහිපයක ආනයන පරිමාව සැලකිය යුතු අන්දමින් පහල වැටීම හා අස්ථාවර වී තිබීම වඩාත් සැලකිල්ලට ගත යුතු කරුණකි. ලෝකයේ ගම්මිරිස් ආනයනයේ ප්‍රධානියා වන ඇමරිකාවේ ආනයන පරිමාව 1997 වර්ෂයට වඩා 1998 වර්ෂයේ මෙ. ටො. 11000 කින් පහත වැටී තිබීම මෙහි විශේෂම ලක්ෂණයයි. වඩාත් ගුණාත්මක නිෂ්පාදන සඳහා ඔවුන් විසින් ඉල්ලුම් කිරීම මීට හේතු වූ එක් කරුණකි.

එනිසා ඉදිරි දශකය තුල ස්ථාවර මිලක් තබා ගැනීමට හා හොඳ ඉල්ලුමක් පවත්වා ගැනීමට ගම්මිරිස් නිෂ්පාදනය කරනු ලබන සියලුම රටවල් අවධානය යොමු කරගත යුතු අතර පහත දැක්වෙන කරුණු කෙරෙහි වඩාත් සැලකිල්ලක් දැක්විය යුතුවේ.

1. ගුණාත්මයෙන් වැඩි නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීම එනම් අපද්‍රව්‍ය අවම වූ නිෂ්පාදන සැකසීම හා එම නිෂ්පාදනවල පලිබෝධනාශක හා ඇප්ලටොක්සින් වැනි දෑ නැති බවට වග බලාගැනීම. මේ සඳහා ගොවීන් හා අපනයන කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ජාතික මට්ටමින් දියත් කළයුතු අතර ප්‍රාදේශීය මට්ටමින් නිෂ්පාදන පිරිසිදුව සැකසීමේ මධ්‍යස්ථාන ඇති කළයුතුය. එමෙන්ම නිෂ්පාදන අපනයනට පෙර තත්ව පරීක්ෂා කිරීමේ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන බිහි කළයුතුය.

2. ගම්මිරිස් ආනයනය කරනු ලබන රටවල ගම්මිරිස් පරිභෝජනය වැඩි කරලීමට හේතුවන ක්‍රියාමාර්ග ගැනීම.

3. ගම්මිරිස් අලුත් නිෂ්පාදන හඳුන්වාදීම. මෙම නිෂ්පාදන පාරිභෝගිකයාගේ අවශ්‍යතාවන් තේරුම් ගෙන ඊට සරිලන පරිදි සැකසූ ඒවා විය යුතුය. එම නිෂ්පාදන පිළිබඳව දියුණු සන්නිවේදන මාර්ග මගින් ලෝක ජනතාව දැනුවත් කළයුතුය.

4. ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදනය පවත්වා ගැනීම.

5. අඩු නිෂ්පාදන වියදම් හා තත්ව දියුනු කිරීමේ පර්යේෂණ නගා සිටුවීම.

ආචාර්ය එච් ඒ රත්නසෝම
පර්යේෂණ නිලධාරි